# සමෘද්ධි බැංකු සංගම්හි ණය කටයුතු සම්බන්ධ ක්‍රියාවලිය

## රටවිරුවෝ නිවාස ණය යෝජනා වැඩසටහන

## (මැද පෙර දිග රටවල් සඳහා යන ශ්‍රමිකයන් වෙනුවෙනි)

**බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 4 ට දාහත්වන එකතුව**

1. සභාපති, පාලක මණ්ඩලය,
   සමෘද්ධි බැංකු සංගමය, ...............................
2. කළමනාකරු,
   සමෘද්ධි බැංකු සංගමය, ...............................
3. සභාපති, විධායක කමිටුව,
   සමෘද්ධි මහ සංගමය, .............................
4. කළමනාකාර අධ්‍යක්ෂ,
   සමෘද්ධි මහ සංගමය, .........................................
5. මුලස්ථාන කළමනාකරු,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ..............................
6. ප්‍රාදේශිය ලේකම්/ නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ......................................
7. සමෘද්ධි සහකාර කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................
8. දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................
9. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................
10. ප්‍රධාන අභ්‍යන්තර විගණක,
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.
11. සාමාන්‍යාධිකාරි සහ සියළුම අධ්‍යක්ෂවරු,
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.
12. ලේකම්,
    ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
    5 වන මහල, අංක 464, ටී.බී. ජායා මාවත,
    කොළඹ 10.
13. සහකාර අධ්‍යක්ෂ නීති
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.


**බැංකු මූල්‍ය කටයුතු අංශය, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**

**2013.06.10**

දුරකථන අංකය :- 0112 - 873798

ෆැක්ස් අංකය :- 0112 - 869494

2013.06.10

# රටවිරුවෝ නිවාස ණය වැඩසටහන

**බැංකු මුලා කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 4 ට දාහත්වන එකතුව**

01. හැඳින්වීම :-

විදේශගත වන ශ්‍රමිකයින් වෙනුවෙන් නිවාස ඉදිකරගැනීම සඳහා රුපියල් ලක්ෂ තුනක (රු.ලක්ෂ 3) ණය මුදලක් ලබාදීම සම්බන්ධව උපදෙස්, මෙහෙයුම් උපදෙස් පත්‍රිකාඅංක 4 ට 16 එකතුව මගින් මේ වන විට ලබා දී ඇත. අදාල චක්‍රලේඛනය හා අදාල ඇමුණුම් අන්තර්ජාලය ඔස්සේ සමෘද්ධි වෙබ් අඩවිය තුලින් ද ලබාගත හැකිය.

1.1 ණය නිකුත් කිරීමේ දී ඉඩම, උකස ලබාගැනීම හා අනෙකුත් පොදු කරුණු සම්බන්ධව හඳුනාගත් ගැටළු සඳහා පහත සඳහන් පරිදි උපදෙස් ලබාදෙන අතර, ඒ පරිදි කටයුතු කරන ලෙස දැනුම් දෙමි.

1.1.1 බැංකු සංගමයට අදාල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල, ඔහුට හෝ ඇයට අයිති වෙනත් ඉඩමක නිවස ඉදිකිරීමට ඉල්ලුම් කරයි නම්, දැනට ඔහු හෝ ඇය පදිංචි වසමට අයිති බැංකුව තුලින් මෙම ණය නිකුත් කිරීම සිදු කළ යුතුය.

1.1.2 ණය මුදල ගෙවා අවසන් වූ පසුව ඔහු/ඇය ගේ පදිංචිය වෙනස් වන අතර, එහිදී අදාල බැංකු සංගමය මාරු කිරීමේ කටයුතු සිදුකළ හැකිය.

1.1.3 ස්වර්ණ භූමි ඔප්පු හා ජය භූමි ඔප්පු ඇති පුද්ගයන්ගේ ඉඩම් බලධාරියා ප්‍රාදේශීය ලේකම්වන බැවින්, මෙම ඉඩම් සමෘද්ධි බැංකු සංගමය වෙත උකස් කිරීමට ප්‍රාදේශීය ලෙක්ම්ගේ ලිඛිත අනුමැතියක් ලබාගත යුතු අතර, එලෙස ලබාගැනීමෙන් අනතුරුව අදාල උකස මත ණය ලබාදිය හැකිය.

1.1.4 රජයේ ඉඩම්වල බදු පදනම මත දීර්ඝ කාලීනව සිටින පුද්ගලයින් මේ යටතේ ණය ඉල්ලුම්කරයි නම් ඒ සම්බන්ධව ඇති නීත්‍යානුකූල භාවය ප්‍රාදේශීය සභාවෙන් හෝ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලිඛිතව කළමනාකරු විසින් විමසිය යුතුය.

1.1.5 ඉහත අංක 1.1.4 යටතේ ඇති ඉඩම්වල පදිංචි පුද්ගලයින් මේ යටතේ ණය ඉල්ලුම් කරයි නම් පලාත් පාලන කොමසාරිස් ගේ ලිඛිත එකඟ තාවය මත ප්‍රධාන කාර්යාලයේ බැංකු මූලා අංශය වෙත එම ඉල්ලුම් කරුවන් පිළිබඳ තොරතුරු ලේඛණ ගත කර ඉදිරිපත් කළ යුතුය.

02. නිවසක් සඳහා අවශා කොටසක් ඉදිකිරීම හෝ අළුත්වැඩියා කටයුතු සඳහා ද මෙම ණය මුදල ලබාදිය හැකිය. සම්පූර්ණ ණය මුදල හෝ පුද්ගලයාගේ අවශාතාවය මත ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වුවද, මේ යටතේ ලබාදිය හැකිය.

2.1 ඉදිකිරීම් සඳහා පිළිගත් රජයේ කාර්මික නිලධාරීවරයකු විසින් සකස් කළ ඇස්තමේන්තුවක් ණය ඉල්ලුම් පත්‍රය සමග ණය ඉල්ලුම්කරු වෙතින් ලබාගත යුතුය.

2.2 ඉහත 2.1 හි එම කටයුතු සඳහා ද අදාල ඉඩමේ උකස ලබාගත යුතුවේ. උදා:- උකස් ලබාගත නොහැකි අවස්ථාවල ඉහත 1.1.5 පරිදි කටයුතු කළ යුතුය.

03. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ විදේශ ගත වී වසරකට පෙර දී මෙරටට පැමිණි අය සඳහා ද නිවාස ඉදිකර කරගැනීම හෝ ඉහත අංක 2 යටතේ දක්වා ඇති පරිදි එම කටයුතු සඳහා ද ණය ලබාදිය හැකිය.

4. රටවිරුවෝ නිවාස ණය වැඩසටහන සම්බන්ධව බැංකු සංගමය පොදු ලෙජරයේ පහත සඳහන් පරිදි ගිණුම් විවෘත කරගත යුතුය.

| | | | | |
|---|---|---|---|---|
| 4.1 | ලැබිය යුතු - රටවිරුවෝ නිවාස ණය ගිණුම | - | කේත අංක | 3114 |
| | බොල් ණය ගිණුම - රටවිරුවෝ නිවාස ණය | - | කේත අංකය | 3217 |

4.2 මෙම ණය වැඩසටහන යටතේ ලබාදෙන ණය මුදල් ආපසු අය කරගැනීමේ දී ලැබෙන පොලිය දැනටමත් පොදු ලෙජරයේ ආදායම් ශීර්ෂය යටතේ හඳුන්වා දී ඇති ලද පොලිය දුන් ණය ගිණුමට බැර කළයුතුය.

05. අවිවාහක පුද්ගලයන් ණය ඉල්ලුම් කිරීමේ දී ඉඩම් අයිතිය දෙමාපියන් සතු නම් පහත සඳහන් පරිදි ණය ලබාදීමේ දී කටයුතු කළ යුතුය.

5.1 දෙමාපියන් අවිවාහක තම දරුවාට තම ඉඩමේ නිවස ඉදිකරගැනීම හෝ අළුත්වැඩියා කටයුතු සඳහා එකඟතාවය ලබාදෙන බවට, ප්‍රකාශයක් ලබාදිය යුතුය.

නොබෙදූ ඉඩම් සම්බන්ධයෙන් එසේ එකඟතාවය ලබාදීමේ දී, වෙනත් දරුවන් ද සිටී නම් ඔවුන් ද මෙම ප්‍රකාශයට අත්සන තැබිය යුතුය.

5.2 ඉහත අංක 5.1 යටතේ ණය ඉල්ලුම් කරන විට අදාල ප්‍රකාශයන් හා ණය ඉල්ලුම් පත්‍රය සමඟ අනුමැතිය සඳහා ප්‍රධාන කාර්යාලයේ බැංකු මූල්‍ය අංශය වෙත යොමුකළ යුතුය.

06. ණය මුදල ඉල්ලුම්කරු විසින් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය මත මූලික තැන්පතු මුදල පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

6.1 සෑම ලක්ෂයකටම රු.10,000 බැගින් ආරම්භක තැන්පතු මුදල ලබාගත යුතුය.

6.2 ණය මුදල නිදහස් කිරීමේ දී තැන්පතු මුදල් ලබාගැනීම අත්‍යවශ්‍ය නොවනු ඇත.

07. දැනට විදේශ ගත වී ඇති ශ්‍රමිකයින් සඳහා ද මෙම ණය නිකුත් කළ හැකි අතර, ඒ සඳහා කොන්දේසි පහත පරිදි වේ.

I. මේ සඳහා දැනට වසරකට පෙර විදේශගත වූ පුද්ගලයන් සඳහා ණය නිකුත් කිරීමට කටයුතු කළ හැකිය.
II. මෙම අයදුම්පත් කාලත්‍රයාගේ අත්සනින් බැංකු සංගමය වෙත ඉදිරිපත් කළ හැකිය.
III. ණය මුදල ඉල්ලුම්කරු ලෙස විදේශගත වූ අය සඳහන් කළ යුතු බැවින්, මෙම අයදුම්පත් කාලත්‍රයාගේ අත්සනින් ප්‍රධාන කාර්යාලයේ බැංකු මූල්‍ය අංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

IV. ඉල්ලුම්කරු ලෙස විදේශගත වූ ශ්‍රමිකයින්ගේ අත්සන, විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා ලබාදීමට ප්‍රධාන කාර්යාලය මගින් කටයුතු කරනු ඇත.

**08. පොදු කරුණු,**

- මෙම වැඩසටහන සම්බන්ධ පසුගිය මස ප්‍රගතිය ඊ ළඟ මස 07 වන දිනට පෙර ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සමාජ සංවර්ධන අංශය වෙත හා බැංකු මූල්‍ය අංශය වෙත එවීමට දිස්ත්‍රික් කාර්යාලයේ සමාජ සංවර්ධන විෂය භාර කළමනාකරු විසින් කටයුතු කළ යුතුය.

- මෙහෙයුම් උපදෙස් අංක 4ට 16 වන එකතුවේ සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

සී.ඩී.කළුආරච්චි,
සාමාන්‍යාධිකාරී.

කේ.කේ.එල්. චන්ද්‍රතිලක,
නි. අධ්‍යක්ෂ-බැංකු මූල්‍ය කටයුතු හා
අධ්‍යක්ෂ-බැංකු මූල්‍ය කටයුතු හා
මහ සංගම්.